
6

# වාක්‍ය රචනය

නාම පද, අවසාන ක්‍රියා පද ආදී වශයෙන් විවිධ පද පිළිබඳ ඉගෙන ගත් ඔබ ඒවා භාවිත කර සරල වාක්‍ය තැනීමේ හැකියාව ලබා ගත්තෙහි ය. දැන් ඒ සරල වැකි එකතු කර, යම් පිළිවෙළකට ගළපා ලිවීමට පුහුණුවක් ලබා ගැනීමෙන් වාක්‍ය රචනාවක් ලියන්නේ කෙසේ ද, කියා ප්‍රමාණවත් අවබෝධයක් ඔබට ලද හැකි ය.

"ළා දලු බෝපත් සෙමෙන් සැලේ " ආදී වශයෙන් යම් පිළිවෙළකට පද ගැළපූවා සේ වාක්‍ය පෙළගැස්මෙහි ද පිළිවෙළක් තිබිය යුතු ය.

පහත සඳහන් රූපය දෙස හොඳින් බලන්න.





නොමිලේ බෙදාහැරීම පිණිස ය.

ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ පිළිබිඹු කෙරෙන මේ ඡායාරූපය පිළිබඳ අපට පහත සඳහන් වාක්‍ය නිර්මාණය කළ හැකි ය.

1. ලෝකවාසී බෞද්ධ ජනතාවගේ ම ඉමහත් ගරු බුහුමනට පත් ජය ශ්‍රී මහා බෝධිය ජාතික වස්තුවක් සේ සලකා සුරැකිය යුතු ය.

2. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ යන ගරු නාමය ලැබීමට පෙර මෙම වෘක්ෂයේ නාමය, 'ඇසතු' ය.

3. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ යන ගරු නාමය එම වෘක්ෂයට ලැබුණේ, අප ගෞතම බුදුරදුන් විසින් තමන් වහන්සේට බුදු වීම සඳහා සෙවණ ලබා දීම වෙනුවෙන් අනිමිස ලෝචන පූජාවෙන් මෙම වෘක්ෂය පුදනු ලැබීමෙන් අනතුරු ව ය.

4. ජය ශ්‍රී මහා බෝධිය ශ්‍රී ලංකාවට වැඩම කරවන ලද්දේ, සඟමිත් තෙරණිය විසිනි.

5. ඉන්දියාවේ පිහිටි ශ්‍රී මහා බෝධිය වර්තමානය වන විට අභාවයට ගොස් ඇති බැවින් එම මුල් බෝධියේ ම දක්ෂිණ ශාඛාවක් වූ අපේ ජය ශ්‍රී මහා බෝධිය ලෝක බෞද්ධ ප්‍රජාවගේ ම අමිල වස්තුවක් බවට පත් වී ඇත.

6. ජය ශ්‍රී මහා බෝධිය ලොව පැරණි ම ඉතිහාසයක් ඇති වෘක්ෂය වශයෙන් ගෞරව බහුමානයට පාත්‍ර වේ.

7. බෞද්ධයන්ගේ මුදුන්මල්කඩක් බඳු ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ වැඩ හිඳින්නේ අනුරාධපුර මහමෙව්නා උයනේ ය.

වෙන වෙන ම කරුණු වශයෙන් දැක්වෙන මෙම වාක්‍ය කිහිපය, එකට කැටි කොට ඡේදයක් වශයෙන් ලියූ විට එය කුඩා වාක්‍ය රචනයක් බවට පත් කර ගත හැකි වෙයි. එහි දී හුදකලා වාක්‍ය මෙන් නොව වාක්‍ය ලිවීමේ පිළිවෙළක් තිබිය යුතු ය. මුලින් ම ලිවිය යුත්තේ කුමන වාක්‍යය ද කියා තෝරා බේරා ගත යුතු ය. ආසන්න වාක්‍ය දෙකක යෙදෙන එක ම වචනය වෙනුවට දෙවෙනි වාක්‍යයේ දී සර්ව නාම (මීන් පෙර පාඩමක දී ඔබ උගත්) යෙදිය හැකි ය. එවිට අනවශ්‍ය පුනරුච්චාරණයක් සිදු නොවන අතර ම සංක්ෂිප්තභාවයක් ද ලැබේ. ඉන් වාක්‍ය රචනයට මනා පෙළගැස්මක් ද ලැබේ. මේ කරුණු පිළිබඳ අවධානයෙන් පහත වාක්‍ය රචනය දෙස නෙත් සිත් යොමු කරන්න.

## ජය ශ්‍රී මහා බෝධිය

ජය ශ්‍රී මහා බෝධිය ලොව පැරණි ම ඉතිහාසයක් ඇති වෘක්ෂය වශයෙන් ගෞරව බහුමානයට පාත්‍ර වේ. ඉන්දියාවේ පිහිටි ශ්‍රී මහා බෝධිය වර්තමානය වන විට අභාවයට ගොස් ඇති බැවින් එම මුල් බෝධියේ ම දක්ෂිණ ශාඛාවක් වූ අපේ ජය ශ්‍රී මහා බෝධිය ලෝක බෞද්ධ ප්‍රජාවගේ ම අමිල වස්තුවක් බවට පත් වී ඇත.
ජය ශ්‍රී මහා බෝධිය ශ්‍රී ලංකාවට වැඩම කරවන ලද්දේ, සඟමිත් තෙරණිය විසිනි.

ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ යන ගරු නාමය එම වෘක්ෂයට ලැබුණේ, අප ගෞතම බුදුරදුන් විසින් තමන් වහන්සේට බුදු වීම සඳහා සෙවණ ලබා දීම වෙනුවෙන් අනිමිස ලෝචන පූජාවෙන් මෙම වෘක්ෂය පුදනු ලැබීමෙන් අනතුරු ව ය. එම ගරු නාමය ලැබීමට පෙර මේ වෘක්ෂයේ නාමය, 'ඇසතු' ය.

බෞද්ධයන්ගේ මුදුන්මල්කඩක් බඳු මෙම ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ වැඩ හිඳින්නේ අනුරාධපුර මහමෙව්නා උයනේ ය. ලෝකවාසී බෞද්ධ ජනතාවගේ ම ඉමහත් ගරු බුහුමනට පත් ජය ශ්‍රී මහා බෝධිය ජාතික වස්තුවක් සේ සලකා සුරැකිය යුතු ය.

මේ වන විට ඔබට රචනාවක් ලිවීම පිළිබඳ මූලික අවබෝධයක් ලැබෙන්නට ඇති. ඒ අවබෝධය තවත් වැඩි දියුණු කර ගත හැකි කරුණු කිහිපයක් පහතින් දක්වා ඇත.

- මාතෘකාවට අදාළ කරුණු පැවසීම
- නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත ව පැහැදිලි අත් අකුරින් ලිවීම
- උක්ත ආඛ්‍යාත ගැළපීම
- සිත්ගන්නාසුලු අයුරින් ලියා දැක්වීම
- රසවත් නිවැරදි බස් වහරක් යොදා ගැනීම
- හැකි සෑම අවස්ථාවක ම කෙටි සරල වැකි යොදා ගැනීම
- කරුණුවල වැදගත්කම අනුව මුල, මැද, අග ඡේද මනා සේ ගැළපීම
  වැනි කරුණු කෙරෙහි නිසි අවධානය යොමු කිරීම

ඉහත කරුණු පිළිබඳ අවබෝධයකින් යුතු ව යම් මාතෘකාවක් යටතේ රචනයක් ලිවීමට ආරම්භ කිරීමට පෙර මූලික ව ම සැකිල්ලක් සාදා ගත යුතු ය. උදාහරණයක් ලෙස 'මා ගිය අධ්‍යාපන චාරිකාවක්' යන මාතෘකාව යටතේ රචනයක් ලිවීමට අවශ්‍ය වුව හොත් මූලික ව ම පහත පරිදි සැකිල්ලක් සාදා ගත හැකි ය.

- චාරිකාව සඳහා මූලික ව කරනු ලබන සංවිධාන කටයුතු හෙවත් සූදානම
- නරඹන ස්ථාන
- එම ස්ථානවල ඓතිහාසික හෝ වෙනත් වටිනාකම්
- නැරඹූ ස්ථාන හා ලැබූ අද්දැකීම්
- සමස්ත චාරිකාවේ වැදගත්කම

මේ එක් එක් කරුණ යටතේ එක් එක් ඡේදය ලිවීමට පුළුවන.

# කුසලතා වර්ධනයට:

1. පහත රූපසටහන දෙස හොඳින් බලන්න.



(අ) මෙම රූපසටහනින් දැක්වෙන්නේ කුමක් ද?

(ආ) රූපසටහනින් දැක්වෙන දේ පිළිබඳ වාක්‍ය රචනයක් ලිවීම සඳහා සුදුසු මාතෘකාවක් යොදන්න.

(ඇ) රචනාව සඳහා සුදුසු සැකිල්ලක් සකස් කරන්න.

(ඈ) එම සැකිල්ලට අනුව වෙන වෙන ම ඡේද වශයෙන් රචනාව ලියන්න.


*නොමිලේ බෙදාහැරීම පිණිස ය.*

1. පහත දී ඇති රුකුල් පද ආධාරයෙන් මේ ප්‍රහේලිකාව පුරවන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 දු | ■ | 2 | 3 ප | ■ | 4 |
| | ■ | 5 | | | ව |
| ■ | 6 | දි | | ■ | |
| 7 | ට | | | ■ | ■ |
| 8 ව | | ■ | ■ | 9 | 10 |
| ■ | 11 ප | | | ව් | ය |
| ■ | | ■ | ■ | | ■ |

හරහට

2. බැංකු ණයක් ගැනීමේ දී බොහෝ විට මේවා තැබීමට සිදු වේ.
5. ගීතයට සමාන වචනයකි.
6. වඩාත් හොඳින් පෙනෙන්නට තිබෙන යන අර්ථයෙන් යෙදේ.
7. පෝය දිනවල ගිහියෝ ද මේ සිල් සමාදන් වෙති.
8. පසළොස්වක පෝය දාට චන්ද්‍රයාගේ මේවා පහළොවක් තිබේ යැයි කියති.
9. නියෝග යන්නට සමාන පදයකි.
11. ගිහියන් නොකර සිටිය යුත්තේ,

පහළට

1. චතුරාර්ය සත්‍යයේ පළමු වැන්නයි.
2. ශ්‍රව්‍ය-දෘශ්‍ය යන්නට සමාන පදයකි.
3. ගිහි බෞද්ධයාගේ නිත්‍ය ශීලය මෙය යි.
4. බෞද්ධයාගේ ආගමික පරමාර්ථය මෙයයි.
6. මෙවැනි පුද්ගලයෝ වර්තමාන සමාජයේ බහුල ව සිටිති.
7. දිගු කලක් භාවිත කළ කල සිවුරු මේ පැහැයට හැරේ.
9 මෙය ඇති විට ඇඳුම් වියළා ගැනීම පහසු ය.
10. මූර්ධජ 'ණ' යන්නෙන් ඇරඹෙන සිංහල භාෂාවේ එක ම වචනය මෙය යි.



නොමිලේ බෙදාහැරීම පිණිස ය.

1. මධ්‍යම පරිසර අධිකාරිය විසින් පළ කර ඇති 'රකිමු අපි පරිසරය' නමැති පරිසර නියමු උපදෙස් පොතේ පහත සඳහන් ගීතය ඇතුළත් වේ. එය හොඳින් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



## පරිසර ගීතය

දෙව් ලොව ද මවු බිමට දෙවැනි කොට සිතන්නෙමු
දෙව් ලොවේ නැති අසිරි මවු බිමේ දකින්නෙමු
පරිසරය රකින්නෙමු, වඩන්නෙමු, වවන්නෙමු
මේ පිළිනයෙන් සදා මවු බිමට බැඳෙන්නෙමු

වලා සිඹ ගලා යන නදී දිය නිරතුරු ය
වන උයන් මල් උයන් පල උයන් විසිතුරු ය
සිසිලසින් පන පොවන මඳ පවන පිවිතුරු ය
පරිසරය රැකෙන තුරු සොබා දම සුමිතුරු ය

තණ්හාව ආසාව ඇයි ද පොදි බඳින්නේ
රටේ වන සම්පතට ඇයි පොරොව නගන්නේ
සොබා දම කිපුණු දා සත් වග මැ නසින්නේ
පරිසරය රකින්නේ මුළු රට මැ රකින්නේ

මේ මිහි මත වසන සත සිතෙහි මෙත වැඩේ වා
ගහ කොළට පවා එම මෙත් සිසිල දැනේ වා
බව බෝග සම්පතින් සතට සෙත සැදේ වා
අපේ හුස්මෙන් පවා පරිසරය නිවේ වා


*පදමාලාව - අරිසෙන් අහුබුදු*

i (අ) මවු බිමට දෙවැනි කොට සිතිය යුත්තේ කුමන ලොව ද?
(ආ) නිරතුරු ව ගලා යන නදී දිය සිඹින්නේ කුමක් ද?
(ඇ) සොබා දම සුමිතුරු වන්නේ කුමක් රැකෙන තුරු ද?
(ඈ) තණ්හා ආසා පොදි බැඳ පොරව නගන්නේ කුමකට ද?
(ඉ) මිහි මත වසන සත්ත්වයන්ගේ සිතෙහි වැඩිය යුත්තේ කුමක් ද?
(ඊ) ගහ-කොළට පවා දැනිය යුත්තේ කුමක් ද?
(උ) අපේ හුස්මෙන් පවා සිදු විය යුත්තේ කුමක් ද?

ii (අ) පහත යෙදුම්වලට සමාන සුදුසු පද ගීතයෙන් තෝරා ලියන්න.

- මාතෘ භූමිය
- ආශ්චර්ය
- ගංගා
- ජලය
- උද්‍යාන
- සුළඟ
- පවිත්‍ර
- තෘෂ්ණාව
- කෝපාවිෂ්ට
- යහපත
- මෛත්‍රිය
- ප්‍රතිඥාවෙන්
- සැමදා
- නිරන්තර
- විචිත්‍ර
- පවිත්‍ර
- වාසය කරන

(අ) ගීතයේ සඳහන් උත්තම පුරුෂ බහු වචන අවසාන ක්‍රියා පද පහක් ලියන්න.
(ආ) එම ක්‍රියාපද ඒක වචනයට හරවා ලියන්න.
(ඇ) දන්තජ 'ල' සහ දන්තජ 'න' අකුරු යෙදී ඇති වචන පහ බැගින් ගීතය තුළින් තෝරන්න. පහත දැක්වෙන සමනලයාගේ රූපය බඳු රූපයක් ඔබේ අභ්‍යාස පොතේ අඳින්න. ඇඳ, එම වචන සමනල තටු දෙකෙහි ලියා දක්වන්න.



iii (අ) රමණීයානි අරඤ්ඤානි ... යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර අදහස ලියා දක්වන්න.

(ආ) පහත දැක්වෙන්නේ බුදුරදුන් හා ස්වාභාවික පරිසරය සම්බන්ධ වාක්‍ය කිහිපයකි. දී ඇති වචන අතුරින් සුදුසු වචනය තෝරා හිස්තැන් පුරවන්න.

1). බුදුරදුන් බෙහෙවින් ප්‍රිය කළේ .......................... (ස්වාභාවික වන සෞන්දර්ය, නැටුම් සන්දර්ශන) නැරඹීමට ය.

2). වෙසක් පොහෝ දිනක සිදුහත් කුමරු මවු කුසින් බිහි වූයේ ද .......................... (පොල්, සල්) ගසක් යට දී ය.

3). ගෞතම බුදුරදුන් සම්බුද්ධත්වයට පත් වූයේ ද .......................... (බෝ ගසක්, කොහොඹ ගසක්) සෙවණේ දී ය.

4). බුදුහිමියන්ගේ මුල් ම ආදර්ශය වූ කළගුණ සැලකීමේ ගුණය ප්‍රකට කළේ ද තමාට බුදු වීමට සෙවණ දුන් .......................... (ඇසතු, පරසතු) වෘක්ෂය දෙස ඇසිපිය නොහෙළා පුරා සතියක් එක දිගට බලා හිඳීමෙන් කරන ලද අනිමිස ලෝචන පූජාවෙනි.

iv (අ) 'රකිමු පරිසරය' මැයෙන් රචනාවක් ලියන්න.